මගේ අංකය- IRM/RTI/AO/1/Info

RTI උපදෙස් 01

සියළුම අංශ ප්‍රධානීන් වෙත

**<u>2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම</u>**

අංක 2004/66 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත, 2017-02-03 දින සිට බලපැවැත්වෙන පරිදි බලාත්මක කර ඇත. මෙම පනත සහ එයට අදාළ ගැසට් නිවේදනය, භාවිතා කළ යුතු ආකෘතීන් හා අනෙකුත් විස්තර www.documents.gov.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

මේ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා ලෙස අතිරේක ලේකම් (විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම්) බී.එම්.එම්.එම්.බස්නායක මිය පත් කර ඇත.

මෙම අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියාට සහය වීම සඳහා අමාත්‍යාංශයේ සෑම අංශයකින්ම මාණ්ඩලික නිලධාරියකු තොරතුරු නිලධාරියකු ලෙස පත් කිරීමට පියවර ගෙන ඇත.

මේ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීමේදී සෑම අංශයක් විසින් ම පහත සඳහන් ක්‍රමවේදයට අනුකූලව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

**1. තොරතුරු ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම**

තොරතුරු ලබා ගැනීම සඳහා මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වන සෑම ඉල්ලීමක්ම අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී අතිරේක ලේකම් (විමර්ශන, පර්යේෂණ හා මෙහෙයුම්) වෙත ඉදිරිපත් විය යුතුය. යම් හෙයකින් කිසියම් අංශයක් වෙත සෘජුවම තොරතුරු ලබා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් වී ඇත්නම්, එම ඉල්ලීම අදාල අංශයේ තොරතුරු නිලධාරී මඟින් අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී වෙත ඉදිරිපත් කළ යුතුය. තොරතුරු ඉල්ලුම් කිරීම ගැසට් නිවේදනයේ නියෝග අංක 4 බලන්න.

අමාත්‍යාංශය වෙත ඉදිරිපත් වන සෑම තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීමක් සඳහාම වෙන වෙනම අනුක්‍රමික අංක ලබා දී රෙජිස්ටරයක් ( ලියාපදිංචි කිරීමේ ලේඛණයක්) පවත්වාගෙන යාමට අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී විසින් කටයුතු කළ යුතුය. අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී විසින් ලබා දෙන අනුක්‍රමික අංකය පදනම් කරගෙන එකිනෙක අංශ විසින් එම අංශයට අදාල තොරතුරු දැනගැනීමේ ඉල්ලීම් සම්බන්ධව එම අංශයේ තොරතුරු නිලධාරියා විසින් වෙන වෙනම රෙජිස්ටර් පවත්වා ගෙන යා යුතුය.

## 2.තොරතුරු ලබා දීම

අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරීයා හරහා කිසියම් අංශයක් වෙත තොරතුරු ලබා ගැනීමේ ඉල්ලීමක් ඉදිරිපත් වූ විට හැකි ඉක්මනින් එම තොරතුරු අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා වෙත ලබා දීමට අදාල අංශයේ තොරතුරු නිලධාරියා විසින් කටයුතු කළ යුතුය.

යම් කිසි තොරතුරක් ලබාදීම පිළිබඳව අවිනිශ්චිතතාවයක් මතුවේ නම් අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරි හා අදාළ අංශයේ ප්‍රධානියා ඒ පිළිබඳව සාකච්ඡා කොට නිගමනයකට එළඹිය යුතුය.

යම් කිසි තොරතුරක් ලබා දීම සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයක එකඟතාවයක් ලබාගත යුතු වන්නේ නම්, අදාල අංශයේ තොරතුරු නිලධාරියා මඟින් ඒ බව අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා වෙත නොපමාව දැන්විය යුතුය. ඒ අනුව අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා විසින් එම තොරතුරු ලබා දීම සම්බන්ධයෙන් අදාල තුන්වන පාර්ශවයේ එකඟතාව ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එවන් අවස්ථාවකදී තොරතුරු ලබා දීම සඳහා අමතර කාලයක් අවශ්‍ය වන බවට තොරතුරු ඉල්ලුම් කළ පාර්ශවය දැනුවත් කිරීමට අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා විසින් පියවර ගත යුතුය.

## 3. තොරතුරු ලබා දීම ප්‍රතික්ෂේප කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධි විධානයන්ට යටත්ව කිසියම් ඉල්ලුම් කරන ලද තොරතුරක් ලබා දීමට නොහැකි වන්නේ නම්, ඒ පනතේ 05 වගන්තියේ සඳහන් කුමන හේතූන් මත ද යන්න අදාල අංශයේ තොරතුරු නිලධාරියා විසින් පැහැදිලිව සඳහන් කොට අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා වෙත ඉදිරිපත් කළ යුතුය.

පනතේ 25 (2) වගන්තියේ සඳහන් පරිදි ඉල්ලුම් කළ දිනයේ සිට වැඩකරන දින 14ක් ඇතුළත ඉල්ලුම් කළ පාර්ශවය වෙත තොරතුරු ලබාදීමට කටයුතු කළ යුතුය. පනතේ 25 (5) යටතේ සඳහන් යම් හේතුවක් මත තොරතුරු ලබාදීමට අමතර කාලයක් අවශ්‍ය වන්නේ නම්, ඒ පිළිබඳව තොරතුරු ඉල්ලුම් කළ පාර්ශවය දින 14ක් ඇතුළත දැනුවත් කිරීමට හැකිවන පරිදි අදාල අංශයේ තොරතුරු නිලධාරි විසින් අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා දැනුවත් කළ යුතුය.

## 4. තොරතුරු සඳහා ගාස්තු අය කිරීම

තොරතුරු ලබාදීම වෙනුවෙන් ගාස්තු අයකල යුතු අවස්ථාවලදී තොරතුරු ලබා දෙන අංශයේ තොරතුරු නිලධාරි විසින් ගැසට් පත්‍රයෙහි සඳහන් "තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභා රීති 2017" යටතේ (4) වන වගන්තියේ ප්‍රතිපාදනයන්ට යටත්ව අය කළ යුතු ගාස්තු තීරණය කර ඒ බව

අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා වෙත ලිඛිතව දැන්විය යුතුය. ඒ අනුව තොරතුරු ඉල්ලා සිටින පාර්ශවය වෙතින් අදාල ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව ගාස්තු අය කර ගැනීමට අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරියා විසින් කටයුතු කළ යුතුය.

තොරතුරු ලබාදීමේ ක්‍රියාවලියට අදාල සන්නිවේදන කටයුතු උක්ත ගැසට් පත්‍රයේ සඳහන් කර ඇති ආකෘතිපත්‍ර මඟින් සිදු කිරීමට අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරී විසින් කටයුතු කළ යුතුය.

මේ සම්බන්ධව වැඩි දුරටත් පැහැදිලි කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ තොරතුරු නිලධාරි, අතිරේක ලේකම් ( විමර්ශන,පර්යේෂණ හා මෙහෙයුම්) බී.එම්.එම්.එම්.බස්නායක මිය අමතන ලෙස දන්වමි.

ජේ.ජේ.රත්නසිරි

ලේකම්

රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් - අංශ නියෝජනය කරන තොරතුරු නිලධාරීන්- දැ.පි.